# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2378/52 – 2024 අප්‍රේල් මස 06 වැනි සෙනසුරාදා – 2024.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 31 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/99/FR/386.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ල/ප්‍රාලේ/3/3/5/2/7.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම් භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 පෙබරවාරි මස 19 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා** –. ප්‍රාදේශීය ලේකම්, ලග්ගල, පල්ලේගම.

2. **ඉඩමේ විස්තරය** –. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ පිටවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිටවල ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මා1707 හා 2017.09.11 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කැබලිවලට මායිම්:

**01. කැබලි අංක 1 – ගෝනමඩවත්ත– ප්‍රමාණය: හෙක්. 11.8959**
උතුරට: ඇළ සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ගෝනමඩවත්ත; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ගෝනමඩවත්ත සහ ඇළ; දකුණට: ඇළ සහ මාර්ග (මා.සං.අ.); බටහිරට: මාර්ග (මා.සං.අ.).

**02. කැබලි අංක 2 – ගෝනමඩවත්ත– ප්‍රමාණය: හෙක්. 0.4111**
උතුරට: ඇළ සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ගෝනමඩවත්ත; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ගෝනමඩවත්ත; දකුණට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ගෝනමඩවත්ත සහ මාර්ග (මා.සං.අ.); බටහිරට: මාර්ග (මා.සං.අ.) සහ ඇළ.

EOG 04 - 0061


1A – G 041725 – 14 (2024/04)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 32 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/5/2018/HA/106.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:DSM/YT/LAND/5/46.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 පෙබරවාරි මස 19 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර", අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා** –. ප්‍රාදේශීය ලේකම්, යටවත්ත.

2. **ඉඩමේ විස්තරය** –. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක E335B මොට්ටුවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අඹන්පොල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මා 1860 ඉඩම් විස්තර ලැයිස්තුවෙහි පිටු අංකය 1 හා 2022.03.18 දිනැති අවසාන ගම් පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – වැවතැන්නේ වත්ත හෙවත් වැවතැන්නේ ගෙදර වත්ත– ප්‍රමාණය: හෙක්. 0.0098**

උතුරට: ඇස්. ජී. ධම්මිකා හිමිකම් කියන වැවතැන්නේ ගෙදර වත්ත සහ එල්. ඩී. එස්. සමරවික්‍රම සහ තවත් අය හිමිකම් කියන වැවතැන්නේ ගෙදර වත්ත; නැගෙනහිරට: එල්. ඩී. එස්. සමරවික්‍රම සහ තවත් අය හිමිකම් කියන වැවතැන්නේ ගෙදර වත්ත සහ මාර්ග (ප්‍රාදේශීය සභා); දකුණට: මාර්ග (ප්‍රාදේශීය සභා); බටහිරට: ඇස්. ජී. ධම්මිකා හිමිකම් කියන වැවතැන්නේ ගෙදර වත්ත.

EOG 04 - 0062

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.